# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

## මිරිස්ස ධීවර වරායේ පොදු වැසිකිළි ප්‍රතිසංස්කරණය කිරීම

**කොන්ත්‍රාත් අංකය : CFHC/PD/RPT/MRS/2026-81**

1. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, මිරිස්ස ධීවර වරායේ පොදු වැසිකිළි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ආසන්න වශයෙන් ඉංජිනේරු ඇස්තමේන්තුව රුපියල් මිලියන 6.26කි. (වැට් බදු සහ අනිශ්චිත වියදම් හැර) ව්‍යාපෘතියේ පිහිටීම : මිරිස්ස ධීවර වරාය (මාතර දිස්ත්‍රික්කය.)

2. ව්‍යාපෘතියේ විස්තරය : මිරිස්ස ධීවර වරායේ වැරගැන්වූ කොන්ක්‍රීට් වහල ස්ලැබ් එකේ පිටතට නෙරූ කොටස කඩා ඉවත් කිරීම, බිත්ති, ටයිල් කොන්ක්‍රීට් වැඩ. ටයිල් වැඩ නිමා කිරීම, කපරාරුව සහ තීන්ත ආලේප කිරීම, ඉදිකිරීම් කාලය දින 90කි.

3. ලංසු තැබීම ජාතික කරගකාරී ලංසු තැබීමේ ක්‍රමවේද යටතේ සිදු කෙරෙන අතර කොන්ත්‍රාත්තුව මැනුම් සහ ගෙවීම් පදනම මත (measure and pay basis) සිදු කරනු ලැබේ.

4. කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකර අසාධු ලේඛන ගත කර නොසිටිය යුතු අතර, ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ CIDA,C8,C7 සහ C6 ශ්‍රේණිවල ලියාපදිංචි වී තිබිය යුතුය.

5. කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමේ සුදුසුකම් අවශ්‍යතා :
   - BSc සමත් සිවිල් ඉංජිනේරු (සංචාරක / (visiting) සහ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවුරුදු 05ක පළපුරුද්ද
   - NCT සුදුසුකම්ලත් සිවිල් අධීක්ෂක (නේවාසික) සහ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවුරුදු 02ක පළපුරුද්ද
   - ලංසු භාරගැනීමේ අවසන් දිනයට පෙර පසුගිය වසර පහ (05) තුළ සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල වාර්ෂික පිරිවැටුම
   - පසුගිය වසර 10 තුළ සමාන ස්වභාවයේ සහ සංකීර්ණත්වයෙන් යුත් අවම වශයෙන් එක් කොන්ත්‍රොත්තුවක ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස පළපුරුද්ද (මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා, සඳහන් කර ඇති වැඩ අවම වශයෙන් 70%ක් සම්පූර්ණ වී තිබිය යුතුය.)
   - ටෙන්ඩර් කළ හැකි වටිනාකම රු. මිලියන 5 ඉක්මවන සෑම ලංසුවක් සඳහා 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ලංසුකරු සතුවිය යුතුය. මෙය ලංසු ප්‍රදානය සඳහා සුදුසුකමකි.

6. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ප්‍රසම්පාදන කළමනාකරු සිවිල් ඉංජිනේරු, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, තැ.පෙ. 1747, රොක් හවුස් පටුමග, කොළඹ 15 යන ලිපිනයෙන් ලබා ගත හැකිය. දුරකථන අංක: 0112529391.

7. ඉංග්‍රීසි භාෂාවෙන් සැකසූ සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක්, උනන්දුවක් දක්වන ලසුකරුවන්ට ආපසු නොගෙවන රුපියල් 2000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව **"ප්‍රසම්පාදන කළමනාකරු, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15"** වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මිලදී ගත හැක. 2026.08.11 දින සිට 2026,09.01 දින දක්වා ඕනෑම රාජකාරී දිනයක උදේ 09.00 සිට පස්වරු 3.00 දක්වා මිලදී ගත හැක.

8. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකක් ලෙස **"ප්‍රසම්පාදන කළමනාකරු, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, තැ.පෙ. 1747, රොක් හවුස් පටුමග, කොළඹ 15"** යන ලිපිනයට 2026.09.02 දින 11.00 පැයට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු, සහභාගී වීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ විවෘත කරනු ලැබේ.

9. 2026.11.18 දින දක්වා ලංසු වලංගු විය යුතුය (ලංසු භාරගැනීමේ අවසාන දින සිට දින 77ක්).

10. සියලුම ලංසු සමග 2026.12.16 දින දක්වා වලංගු රුපියල් හැට අට දහසක (රු. 68,000.00) ලංසු ඇපකරයක් අමුණා තිබිය යුතුය. {ලංසු වලංගු කාලය + දින 28}, එය සම්මත ආකෘති පත්‍රයේ 9 වන කොටසේ අඩංගු ආකෘතියෙන් තිබිය යුතු අතර, **"සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, තැ.පෙ. 1747, රොක් හවුස් පටුමග, කොළඹ 15"** යන නමින් විය යුතුය. ලංසු ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියලත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබා තිබිය යුතුය. මුදල් තැන්පතු ද භාර ගනු ලැබේ.

11. පූර්ව ලංසු රැස්වීමක් 2026.08.21 දින 11.30 පැයේදී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, තැ.පෙ. 1747, රොක් හවුස් පටුමග, කොළඹ 15 යන ලිපිනයේදී පැවැත්වේ.

12. විෂමතා මගහරවා ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට පෙර ITB යේ ICTAD SBD/03 අතිරේකය සහිත දෙවන සංස්කරණය හොඳින් කියවා බලන ලෙස සියලුම ලංසුකරුවන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

**සභාපති,**
**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,**
**අංක 15, තැ.පෙ. 1747,**
**රොක් හවුස් පටුමග, කොළඹ 15.**